# ජනනායක තමිල් තේසිය කුට්ටනි - ව්‍යවස්ථාව

**සන්ධානයේ නම :- ජනනායක තමිල් තේසිය කුට්ටනි**

**1.අරමුණ :-**

ද්‍රවිඩ ජනතාවන් ජාතියක් යන පදනම මත, ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ප්‍රදේශය ජනතාවගේ සම්ප්‍රදායික නිජබිම යන පදනම මත ද, ඔවුන්හට අනන්‍ය භාෂාවක්, සංස්කෘතිය හා සම්ප්‍රදායන් ඇති අතර, ඔවුන්හටම අයත් ආර්ථික සම්පත් ඇති අය යන පදනම මත ද, ජාතියන්තර නීතියට අනුව, දෙමළ ජනතාවන් ස්වයං නිර්ණය සඳහා අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට හිමිකම් පවතී. එය ඔවුන්ගේ ජන්ම අයිතියක් වන බැවින්, දෙමළ ජාතික ජනවාරික අර්බුදයට ස්ථිර දේශපාලන විසඳුමක් සෙවීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී දෙමළ ජාතික සන්ධානය කැපවී ඇත.

**02.ප්‍රතිපත්තිය :-**

2.1. ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු භාෂාමය, බහු සංස්කෘතික සහ බහු ආගමික රටක් බව පිළිගෙන ජාතීන් අතර, සමානාත්මතාවය, ගෞරවය, සහ ජාතීන්ගේ අනන්‍යතාවය පිළිගෙන එය ඉදිරියට ගෙනයෑම සඳහා අවශ්‍ය කටයුතු තමිල් තේසිය කුට්ටනිය විසින් සිදු කරනු ලැබේ.

2.2 ෆෙඩරල් පදනමත මත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජාතික ජනවාරික ගැටලුව විසඳීමට යාන්ත්‍රණ නිර්මානය කිරීම සඳහා මග පාදනු ඇතැයි යන

පදනම මත ද, ශ්‍රී ලංකාවේ ෆෙඩරල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මානය කිරීමට තමිල් තේසිය කුඩ්ටනි විසින් සහාය දක්වනු ඇත.

2.3 උතුරු නැගෙනහිර ප්‍රදේශයේ වාසය කරන සියලුම ජනතාවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා එය සහතික කිරීම.

2.4 උතුරු නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක වන සියලුම ආගමික නිකායන්ට තම ආගම ඇදහීමට හා පූජනීය කටයුතුවල නිරතවීමේ නිදහස සුරක්ෂිත කිරීම.

2.5 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි, සියලු ජනතාවන්ගේ මූලික අයිතිවාසිකම් සහතික කිරීම.

2.6 සන්ධානයේ අරමුණ සාක්ෂාත්කර ගැනීම ඉලක්ක කරගෙන විදේශයන් හි ජීවත්වන දෙමළ සමාජ අතර, අපගේ අරමුණ පැහිදිලි කර ඉදිරියට ගෙන යැම සඳහා ක්‍රියාකාරකම් සිදු කිරීම.

2.7. ජනවාර්ගික ගැලටුව විසදීම හා උතුරු නැගෙනහිර සංවර්ධනය සඳහා ජාත්‍යන්තර විශේෂඥයින්ගෙන් සහාය සහ සහයොග්ය ලබා ගැනීම.

2.8. අපගේ අරමුණ හා මූලධර්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී මට්ටමෙන් සිදු කළ යුතු සියලු කටයුතු තමිල් තේසිය කූට්ටනි විසින් සිදු කරනු ලැබේ.

**3.සාමාජිකත්වය :-**

3.1 මෙම සන්ධානය සාමූහිකව ක්‍රියාත්මක වන්නේ එහි සාමාජිකයෙකු වන සෑම දේශපාලන පක්ෂයකම, දේශපාලන සංවිධානයකම සහ පුද්ගලයින්ගේ අභිමතය පරිදි වේ. දෙමළ ජාතික සන්ධානයේ ව්‍යවස්ථාවේ අරමුණ, ප්‍රතිපත්ති සහ විධිවිධාන පිළිගන්නා අයට මෙම සන්ධානයේ සාමාජිකයන් විය හැකිය.

3.2 තමිල් තේසිය සන්ධානයේ ආරම්භක සාමාජිකයන් වශයෙන් දෙමළ ඊලම් විමුක්ති ව්‍යාපාරය, ප්‍රජාතන්ත්‍රවාදී ජනතා විමුක්ති පෙරමුණ, ඊලාම් ජනතා

විප්ලවවාදී විමුක්ති පෙරමුණ, දෙමළ ජාතික පක්ෂය සහ ප්‍රජාතන්ත්‍රවාදී සටන්කරුවන්ගේ පක්ෂය ඇතුලත් වේ.

3.3 ඉහත අරමුණ සහ මූලධර්ම පිළිගත් දේශපාලන පක්ෂ සහ දේශපාලන සංවිධාන හා පුද්ගලයින් මෙහි එක්වීමට කැමැත්ත දක්වන අවස්ථාවේ දී, විධායක කමිටුවේ පූර්ණ සහයෝගය ඇතිව හෝ විධාකය කමිටුවේ බහුතර සහයෝගය ඇතිව මෙම සන්ධානයේ එක්වී කටයුතු කළ හැකිය.

3.4 මෙම සන්ධානයේ සාමාජිකත්වය දරණ පක්ෂවල හෝ දේශපාලන සංවිධානවල සාමාජිකයින් සන්ධානයේ සාමාජිකයින් ලෙස සලකනු ලැබේ.

3.5 දේශපාලන ක්‍රියාකාරකම් සම්බන්දයෙන් අවධානය යොමු කිරීමේ දී, සන්ධානයේ සාමාජිකත්වය දරණ දේශපාලන පක්ෂ සහ සංවිධානය ප්‍රජාතන්ත්‍රවාදී දෙමළ ජාතික සන්ධානය යනුවෙන් කටයුතු කරයි.

3.6. මෙහි සාමාජිකත්වය දරණ දේශපාලන පක්ෂ ස්වාධීනව කටයුතු කිරීමට, පූර්ණ නිදහස ඇත. එසේම, ස්වාධීනව කටයුතු කිරීම වනාහි,

05 JAN 2026

තමිල් තේසිය කුට්ටමපින් අරමුණ හා මූලධර්මලවලට හානිවිය හැකි පරදි කටයුතු කල නොහැකිය.

## 4.විධායක කමිටුව

අ. තමිල් තේසිය සන්ධානයේ සියලු තීරණය ගැනීමේ ඉහළම ආයතනය වශයෙන් විධායක කමිටුව පවතී. මෙම විධායක කමිටුව වෙත තමිල් තේසිය කුට්ටනියෙන් සාමාජිකත්වය දරණ පක්ෂයෙන් සාමාජිකයින් පත් කරනු ලැබේ.

ආ. සාමාජික පක්ෂයෙන් එක් එක් පක්ෂය විධායක කමිටුව සඳහා සාමාජිකයින් නම් කරනු ඇත.

ඇ. සෑම සාමාජික පක්ෂයක්ම විධායක කමිටුවට සාමාජිකයින් තිදෙනෙකු පත් කරනු ඇත.

ඇ. තීරණය ගැනීමේ උත්තරීතර සභාවේ (විධායක කමිටුවේ) කාන්තාවන් ද සාමාජිකත්වය දැරිය යුතුය යන පදනම මත තමිල් තේසිය සන්ධානයේ සාමාජිකත්වය දරන සෑම පක්ෂ විසින් සිවුවැනි සාමාජික වශයෙන් කාන්තාවක් නම්කරීමට නිර්දේශය කළ යුතුය.

## 4.1 විධායක කමිටුවේ කටයුතු :-

අ. මෙම විධායක කමිටුව තමිල් තේසිය සන්ධානයේ කොටසක් විය හැකි පක්ෂවල නායකයන්ගෙන් සමන්විත සම සභාපතිත්වයෙන් යුතුය. තවද මෙම විධායක කමිටුව, පක්ෂයේ මහලේකම්, සම්බන්ධීකරණ ලේකම්, භාණ්ඩාගාරික, ප්‍රකාශක, සහ ජාතික සංවිධායක ද තෝරා පත්කරනු ඇත.

ආ. මෙම අයගේ ධූර කාලය වසර දෙකක් වනු ඇත.

ඇ. ඉහත නිලදාරින් තෝරාගැනීමේ දී, සියලු පක්ෂවලට නායකත්වයට සහභාගි වීම සඳහා හැකිතාක් දුරට සියලු පක්ෂවල නියෝජිතයින්ට ද සහභාගි වීමට හැකි විය යුතුය.

ඇ. පක්ෂයේ මූල්‍ය කටයුතු පරිහරනය කරන භාණ්ඩාගාරිකගේ ප්‍රධානත්වයෙන් මූල්‍ය කමිටුවක් පිහිටුවනු ඇත. සාමාජික පක්ෂවල නියෝජිතයින් මෙම මූල්‍ය කමිටුවේ සාමාජිකයින් වනු ඇත.

ඉ. බැංකු චෙක්පත් පරිහරනය කිරීම සඳහා තමිල් තේසිය සන්ධානයේ භාණ්ඩාගාරික හා මහලේකම් වරයාට අත්සන් කිරීමට බලය ඇත.

05 JAN 2026

ජ. රජ්‍ය සමග සාකච්ඡා පැවත්වීම, ඩයස්පෝරා සංවිධානය සමග සබඳතා පවත්වා ගැනීම, නැවත පදිංචි කිරීම, ජිවනෝපායන් නියාමනය කිරීම, ඉඩම් නිදහස් කිරීම හා ආරක්ෂා කිරීම, දෙමළ සංස්කෘතියහ ා උරුමයන් ප්‍රවර්ධනය කිරීම. උතුරු නැගෙනහිර පිහිටි පුරාණ ලාංජන

සහ පුරාවිද්‍යාත්මක ස්ථාන එවාගේ පෞරාණිකත්වය වෙනස් නොකර සංසරක්ෂණ කිරීමට සුදුසු කමිටු හා උප කමිටු පත් කිරම්

ඌ. දේශපාලන තත්ත්වය සම්බන්ධයෙන් තීරණය ගැනීමට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට විධායක කමිටුව අවම වශයෙන් මසකට වරක් රැස්වනු ඇත.

ඌෟ. විධානය කමිටුවේ සාමාජිකයෙකු ඉවත් කළහොත්, හෝ ඉල්ලා අස්වුවහොත් සිදුවන පුරප්පාඩුව පිරවීම සඳහා අදාල පක්ෂය විසින් නව සාමාජිකයෙකු පත් කරනු ඇත.

එ. විධායක කමිටු සාමාජිකයින්ගේ ධූර කාලය වසරකි. වසරක අවසානයේ එම පක්ෂවය විසින් එම පුද්ගලයා හෝ පක්ෂය වෙනුවෙන් වෙනත් පුද්ගලයෙකු විධායක කමිටු සාමාජික වශයෙන් පත් කළ හැකිය.

4.2 උප සභාපතිවරුන්ගේ කටයුතු :-

අ. සම සභාපතිවරුන්ගෙන් එක් අයෙකු විධායක කමිටු රැස්වීමට මුලසුන හොබවනු ඇත.

ආ. සාමාජික පක්ෂය තුළ ගැටලු ඇතිනොවන අයුරින් ඔවුන් අතර සමගිය ශක්තිමත් කිරීමට උත්සාහ කරනු ඇත.

ඇ. ප්‍රජාතන්ත්‍රවාදි අරමුණුවලට ගෞරවය කර සියලු සාමාජිකයන්හට සමාන අවස්ථා ලබා දීම සහතික කරනු ඇත.

4.3.ලේකම්වරයාගේ රාජකාරි :-

අ. විධායක කමිටුවේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

ආ. විධායක කමිටුවේ මාසික රැස්වීම කැඳවා රැස්වීම් වාර්තා සකස්කර ඊළග රැස්වීමේ දි කියවීමට කටයුතු කරනු ඇත.

ඇ. තමිල් තේසිය සන්ධානයේ සාමාජික පක්ෂ අතර සම්බන්ධිකරණය පිහිටුවීම.

ඈ. මැතිවරණ කොමිසම සම්බන්ධයෙන් සියලු ලියකියවිලි නඩත්තු කිරීම හා සහභාගි - ඒට අදාල වාර්තා විධායක කමිටුවට ඉදිරිපත් කිරීම.

ඉ. ලේකම්ගේ .තනතුරෙහි ඇබෑර්තු පවතින විට විධායක කමිටුව රැස්වී නව ලේකම් වරෙයෙකු පත්කිරීමට කටයුතු කරනු ලැබේ.

4.4.භාණ්ඩාගාරිකගේ රාජකාරි :-

අ. තමිල් තේසිය සන්ධානයේ විධායක කමිටුව විසින් භාණ්ඩාගාරිකයෙකු පත්කරනු ලබන අතර. ඔහුගේ නායකත්වයෙන් මූල්‍ය කමිටුවක් පත් කරනු ඇත.

ආ. භාණ්ඩාගාරික හා මූල්‍ය කමිටුව එක්වී තමිල් තේසිය සන්ධානය වෙනුවෙන් මූල්‍ය සම්පත් උත්පාදනය කර නඩත්තු කිරීම

ඇ. භාණ්ඩාගාරික විසින් සෑම මාස හයකට වරක් මූල්‍ය වාරථාවක් විධායක කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

4.5.නිල ප්‍රකාශක :-

අ. තමිල් තේසිය සන්ධානයේ විධායක කමිටුව විසින් පක්ෂය සඳහා නිල ප්‍රකාශකයෙකු පත් කරනු ඇත

ආ. තමිල් තේසිය සන්ධානයේ සාමාජිකත්වය දරණ පක්ෂවල නායකයාට හෝ ලේකම්වරයාට සන්ධනයේ ප්‍රතිපත්තිමය අරමුණ හා දේශපාලන තත්ත්වය සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට හිමිකම් ඇත.

ඇ. නිල ප්‍රකාශක විසින් තමිල් තේසිය සන්ධානයේ ප්‍රතිපත්තිමය අරමුණුවලින් බැහැර නොවී සහ විධායක කමිටුවේ තීරණවලට අනුකූලව අදහස් පල කල යුතුය.

ඈ. නිල ප්‍රකාශක තනතුර සඳහා පුරප්පාඩු වුවහොත් විධායක කමිටුව රැස්වී එම පුරප්පාඩුව පිරවීම සඳහා නව පුද්ගලයෙකු පත් කරනු ඇත.

4.6 ජාතික සංවිධායක :-

අ. තමිල් තේසිය සන්ධානයේ විධායක කමිටුව විසින්. පක්ෂයේ ජාතික සංවිධායක ලෙස පුද්ගලයෙකු තෝරාපත්කර ගනු ඇත. ජාතික සංවිධායකවරයාට ඔහුගේ රාජාකාරිය පහසු කිරීම සඳහා පළාත් සංවිධායකවරුන් පත් කළ හැකිය.

05 JAN 2026

ආ. තමිල් තේසිය සන්ධානය ග්‍රාමීය වශයෙන්. කොට්ඨාශ වශයෙන්, මැතිවරණ කොට්ඨාශ වශයෙන් හා පළාත් මට්ටමෙන් ශක්තිමත් කිරීම සඳහා ජාතික සංවිධායක විසින් කටයුතු කරනු ලැබේ.

ඇ. තමිල් තේසිය සන්ධානයේ මැතිවරණ කොට්ඨාශ සහ පළාත් සමුලු පැවත්වීමට හා සන්ධානයේ සමුලු පැවැත්වීම සඳහා පියවර ගනු ඇත

ඈ. තමිල් තේසිය සන්ධානයේ සාමාජික ශාඛාවන් වන ශිෂ්‍ය, .තරුණ, කාන්තා, හා වෘත්තිය සමිති කණ්ඩායම් පිහිටුවීමේ රාජකාරි සිදු කරනු ඇත.

**5.ප්‍රධාන කාර්යාලය :-**

අ. තමිල් තේසිය සන්ධානය වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයක් ස්ථාපිත කරනු ඇත.

ආ තමිල් තේසිය සන්ධානය සියලු ලේඛණ සකස්කිරීම හා සම්බන්ධිකරණය කිරීමේ මධ්‍යස්ථානය ලෙස ක්‍රියිකරනු ඇත.

ඇ. විධායක කිමිටුව විසින් මේ සඳහා අවශ්‍ය පිරිස් බලය සුදුසු පුද්ගලයින්ගෙන් හා විශේෂඥයින්ගෙන් පත්කරනු ලැබේ.

ඈ. ද්‍රවිඩ ජනතාවන් මුහුණ දෙන සියලු ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාකරනු ඇත.

ඉ. ප්‍රධාන කාර්යාලයේ පරිපාලනය කටයුතු මෙහෙයවා කළමණාකරණය කිරීම සඳහා විධායක කමිටුව විසින් පළපුරුදු පරිපාලකයෙකු ප්‍රධාන කාර්යාලයේ පරිපාලන ලේකම් වශයෙන් පත් කරනු ඇත.

**6.විනය කමිටුව :-**

අ. තමිල් තේසිය සන්ධානය විසින් විනය. නීති රීති සහ රෙගුලාසි සම්පාදනය කර එය තම සාමාජික පක්ෂ සහ සංවිධානවලට නිකුත් කරනු ලැබේ.

ආ. විධායක කමිටුව විසින් අවශ්‍ය පරිදි විනය කමිටුව පත්කරනු ඇත.

ඇ. තමිල් තේසිය සන්ධානයේ විනය නීති උල්ලංඝනය කරන පුදුගලයින්ට හෝ පක්ෂවලට එරෙහිව විධායක කමිටුව විසින් පත් කරන ලද කමිටුව විසින් විනය පරික්ෂන කටයුතු පවත්වනු ඇත.

ඈ. මෙම විමර්ශනය අනුව විධායක කමිටුව විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

05 JAN 2026
නීති අංශය
රාජගිරිය

අත්කලේ

කේ.එන්.රට්නලිංගම්.

ලේකම්.

ජනනායක තමිල් තේසිය කුට්ටනි

M.KANDEEPAN.B.A
HIGH COURT INTERPRETER &
SWORN TRANSLATOR
JUSTICE OF PEACE (WHOLE ISLAND)
REG NO: 16/12 / NR / WHOLE ISLAND/ 552
HIGH COURT - NORTHERN PROVINCE
VAVUNIYA - SRI LANKA
T.P NO 077-9994834

05 JAN 2026